NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 11 ශ්‍රේණිය | නර්තනය | 1.2 ඒකකය |
|---|---|---|

## විවිධ චරිත නිරූපණය කරමු.

- **හිස්තැනට නිවැරදි පිළිතුර තෝරන්න.**

01. පංති කාමරයේ තේමාවක් ඇසුරින් චරිත නිරූපණය කිරීමේදී අවධානය යොමු කළ යුතු අංගයකි, ..........

(1). භාව නිරූපණය (3). අංග රචනය
(2). රංග වස්ත්‍රාභරණ (4). පසුතල

02. වචන මාධ්‍යයෙන් අදහස් ප්‍රකාශනය .............. අභිනය ලෙස හැඳින්වේ.

(1). ලිඛිත (2). භාෂික (3). වාචික (4). ජාතික

03. කාන්තා චරිත නිරීපණයේ දී .............. බව මතු විය යුතුය.

(1). තාණ්ඩව (2). අඛණ්ඩව (3). ග්‍රාම්‍ය (4). ලාස්‍ය

04. ''ශාන්ත'' නමැති ස්ථායී භාවය නිරූපණයේදී මුහුණෙහි දක්නට ලැබෙන සුවිශේෂ ලක්‍ෂණයකි, ..............

(1). ඇස් අඩවන් වීම (3). ඇස් මළානික වීම
(2). ඇස් විශාල වීම (4). ඇස් දුරුවර්ණ වීම

05. මුහුණෙහි වැඩි වශයෙන් ඇත්තේ .............. යන් ය.

(1). අංග (2). උපාංග (3). ප්‍රත්‍යංග (4). පාදාංග

(ලකුණු 2×5 = 10)

- **සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.**

01. බොදු බැති ගී ශ්‍රවණයේ දී ................................ භාවය මතු කර ගත හැකිය.
02. අප්‍රසන්න යමක් දුටු විට ................................ රසය ඇතිවේ.
03. මළ බෙර වාදනයක් ඇසීමෙන් මතුවන්නේ ................................ භාවය යි.
04. සොකරි ජන නාටකයේ දී සොකරියගේ චරිතය ඉදිරිපත් කිරීම තුළින් ................................ රසය උද්දීපනය කෙරේ.
05. තුරඟා වන්නමෙන් කියැවෙන්නේ ................................ රසය යි.

(ලකුණු 2×5 = 10)

- **පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. නර්තනය මාධ්‍ය කොට ගෙන සත්ත්ව චරිත යොදා ගනිමින් ගැළපෙන තේමාවක් සහිතව කෙටි සිද්ධියක් ලියා දක්වන්න.
02. සමාජයට ආදර්ශයක් සැපයිය හැකි මිනිස් චරිත සහිත නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැකි කෙටි සිද්ධියක් ලියන්න.
03. නර්තනය මාධ්‍ය කොට ගෙන චරිත නිරූපණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු 5ක් නම් කරන්න.

(ලකුණු 10×3 = 30)